# ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

## ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ලබා ගැනීම සඳහා

## උපදෙස් මාලාව

1. ඕනෑම පුද්ගලයකු පහත සුදුසුකම් සම්පූර්ණ කරන්නේ නම්, ඔහු / ඇය ආශ්‍රිත සාමාජිකත්වයට සුදුසුකම් ලබයි.
අ. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන විභාගය / III මට්ටම / උසස් ඩිප්ලෝමාව සමත් වී ඇත. එසේ නැතිනම් ඊට සමාන හෝ ඉහළ වෘත්තීය සුදුසුකමක් ලබා තිබේ.
ආ. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ආශ්‍රය නොවන සාමාජිකයෙකි.
ඇ. පුස්තකාල ක්ෂේත්‍රයේ වසර පහක පූර්ණ කාලීන සේවයක් සම්පූර්ණ කර ඇති අතර ඉහත 1 'අ' හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අවම වශයෙන් අවුරුදු දෙකක්වත් ජ්‍යෙෂ්ඨ පුස්තකාලවේදියකු ගේ අධීක්ෂණය යටතේ සේවය කර ඇත.
2. ඔබගේ අයදුම්පත SLLA කාර්යාලයට ලැබුණු විට ...
අ. පළමුව එය කාර්යාල කාර්ය මණ්ඩලය විසින් පරීක්ෂා කරනු ලැබේ
ආ. එවිට එය ප්‍රධාන ලේකම් / අධ්‍යාපන නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලැබේ. ඉන්පසු ආසන්නතම විධායක සභා රැස්වීමේදී සභාගත කෙරෙනු ඇත.
ඇ. විධායක සභාව විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ඔබව සම්මුඛ පරීක්ෂණයට ලක් කරනු ඇත:
ඈ. අවසාන වශයෙන් ඔබගේ අයදුම්පත ආසන්නතම පාලක සභා රැස්වීමේදී සභාගත කර එහි අනුමැතිය ලබා ගනු ඇත.
3. නිවැරදිව දත්ත ඇතුළත් කිරීම සඳහා මුද්‍රිත අයදුම්පත බ්ලොක් කැපිටල් අකුරුවලින් ඉතා පැහැදිලිව පුරවා තිබිය යුතුය (මාගර්ගතව ඉදිරිපත් කරන අයැදුම්පත් සඳහා මෙය අදාළ නොවේ). ඔබගේ අයදුම්පතේ අන්තර්ගතය අවිනිශ්චිත නම් එය සමාලෝචනය නොකර ඔබ වෙත එවනු ලැබේ.
4. ඔබගේ අයදුම්පතේ සඳහන් සියලු කරුණු පිළිබඳ ලේඛනමය සාක්ෂි (පිටපත්) සමඟ ඔබේ අයදුම්පත ඉදිරිපත් කරන්න (මාගර්ගත අයැදුම්පත ඉදිරිපත් කිරීමේදී වෙනම පණිවුඩයක් අදාළ ඇමුණුම් සමග info@slla.lk ඊමේල් ලිපිනයට එවන්න). එසේ ම ඔබේ සේවා වාර්තාව සහතික කිරීම සඳහා (මුද්‍රිත අයදුම්පතේ 10 වන අංකය) ඔබේ සේවායෝජකයින්ගෙන් ලිපි ඉදිරිපත් කරන්න.
5. ඔබගේ අයදුම්පත සමඟ ඉදිරිපත් කරන ලද සහතිකවල සියලුම පිටපත් අදාළ බලයලත් නිලධාරියා විසින් සහතික කළ යුතුය. උදා: විශ්ව විද්‍යාලයක නම් ලේඛකාධිකාරී (විභාග) ආදිය.
6. ශිෂ්‍යයකුව සිටියදී ලබා ගත් රැකියා පුහුණුව රැකියාවක් ලෙස නොසැලකේ. එබැවින් ඔබේ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු වැඩිදුර පුහුණුවක් ලබා ඇත්නම් මිස, ඔබේ පුහුණු කාලය 10 වන වගන්තියට (රැකියා වාර්තාව) ඇතුළත් නොකළ යුතුය.
7. ඔබගේ අයදුම්පත සමඟ ඉදිරිපත් කර ඇති සියලුම සහතික සහ ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.
8. පාලක සභාව විසින් අනුමත කරන ලද දිනය ආශ්‍රිත සාමාජිකත්වය බලපැවැත්වෙන දිනය වේ.
9. ආශ්‍රිතභාවය ප්‍රදානය කිරීමට සභාව තීරණය කළ දින සිට මාස තුනක් ඇතුළත අයදුම්කරුවන් ලියාපදිංචි විය යුතුය. එසේ නොවේ නම්, අයදුම්කරු නැවත අයදුම් කළ යුතුය.
10. එම වර්ෂයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී ආශ්‍රිත සහතිකය ප්‍රදානය කෙරේ.